# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010

### මානවශාස්ත්‍ර පීඨය

### නාට්‍ය හා රංග කලාව - DMAT E3015

### නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. යුරෝපයේ යථාර්ථවාදී නාට්‍ය කලාවක් බිහිවීමට බලපෑ හේතු සාධක විමසුමට ලක් කරන්න.

02. යථාර්ථවාදී නාට්‍ය රීතිය අනුගමනය කළ නාට්‍යකරුවන් අතර හෙන්රික් ඉබ්සන් සුවිශේෂී වන්නේ කෙසේදැයි විමසන්න.

03. ස්ටැනිස්ලව්ස්කිගේ රූපණ සිද්ධාන්ත මගින් නළුවාට චරිතය ගොඩනගා ගැනීමට නව ප්‍රවේශයක් ලබා දෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

04. "ඉබ්සන්ගේ නාට්‍ය අතරින් සමාජ ගැටලු විභාග කළ නාට්‍ය ගණයට 'බෝනික්කි ගෙදර' (A Doll's House) හොඳ උදාහරණයකි." සාකච්ඡා කරන්න.

05. ඇන්ටන් චෙකොෆ්ගේ 'චෙරිවත්ත' ඛේදාන්ත නාට්‍යයක්ද? සුඛාන්ත නාට්‍යයක් ද? ඔබේ මතය හේතු සාධක සහිතව සනාථ කරන්න.

06. එපික් රංග රීතියේ මූලික ලක්ෂණ හඳුන්වා දී ඒවා බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍ය කෘතිවලින් ප්‍රකටවන ආකාරය පෙන්වා දෙන්න.

07. අසම්මත නාට්‍යවල ඔබ දකින සුවිශේෂතා 'ගොඩෝ උන්නැහේ එනකං' නාට්‍යය නිදසුන් කොටගෙන විමසන්න.

08. ඇමරිකානු නාට්‍ය කලාව කෙටි කාලයක් තුළ උසස් දියුණුවක් ලැබීමට හේතු වූ කරුණු පෙන්වා දෙන්න.

09. ටෙනසි විලියම්ස්ගේ කාව්‍යාත්මක භාෂා විලාසය ඔහුගේ 'පුංචි පළිඟු රූප' නාට්‍යය ඇසුරෙන් විමසන්න.

***************************